සීමාන්විතයි

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි)
යුද්ධ හමුදා කඳවුර
වව්නියාව

ආසේමු(ව)/ප්‍ර/සිවිල්/ක්ලීන් ශ්‍රී ලංකා/01 (78)

21 පාබල සේමු

2025 මාර්තු මස 24 දින

**ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ අනුරාධපුර දුම්රිය පොල තුළ පිරිසිදු පරිසරයක් ඇතිකිරීම**

යොමුව: ක්‍රියාඅම/ක්ලීන් ශ්‍රීලංකා/02/06 (01) හා 2025.03.24 වන දිනැති යුද්ධ හමුදා ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘති ලිපිය.

1. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සංචාරක ගමනාන්තයක් ලෙස අනුරාධපුර නගරය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිව අනුරාධපුර දුම්රිය පොල පිරිසිදු ස්ථානයක් බවට පත්කිරීම සිදුකල යුතුව ඇති අතර, එය එළඹෙන අලුත් සහල් මංගල්‍යයට පෙර නිමකල යුතුව ඇති බැවින් ඒ සඳහා දුම්රිය පොල පරිශ්‍රය තුළ පහත සඳහන් කටයුතු සිදුකල යුතුව ඇත.

අ. පරිසරය පිරිසිදු කිරීම සහ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම.
ආ. පින්තාරු කිරීම.
ඇ. මහජනතාවගේ පහසුව සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
ඈ. අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩපිළිවෙලක් ඇති කිරීම.
ඉ. දුම්රියපොළ ආසන්න දුම්රිය මාර්ගය දෙපස පිරිසිදු කිරීම.

2. තවද, මේ සඳහා දුම්රිය දෙපාර්තමේන්තු කාර්‍ය මණ්ඩලය සහ ස්වෙච්ඡා කණ්ඩායම් සහභාගී වීමට නියමිත අතර, දුම්රිය පොල යාවත්කාලීන කිරීමේ කටයුතු **2025** අප්‍රේල් මස **03** දිනට අවසන් කල යුතු බැව් යොමුගත ලිපිය මගින් දැනුම් දී ඇත. ඒ අනුව **2025** මාර්තු මස **25** දින දුම්රියපොල නිරීක්ෂණ කටයුතු සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකල යුතු අතර, එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි එකඟතාවයන් ඇතිකර ගත යුතුය.

අ. කලයුතු කාර්යයන්, කාලරාමුව හා අනු වගකීම්.
ආ. පොදු ශ්‍රමදානයක් ලෙස පිරිසිදු කිරීමේ කටයුතු සිදුකරන දිනයන්.
ඇ. කලයුතු අලුත්වැඩියාවන් හා ඒ සඳහා වන ඇස්තමේන්තු කාර්යයන් වෙන් වෙන්ව.
ඈ. ශ්‍රම අවශ්‍යතාවය (පුහුණු/නුපුහුණු) හා දායකත්වය.
(යුද හමුදා/දුම්රිය දෙපාර්තමේන්තුව) කාර්යයන් වෙන් වෙන්ව.
ඉ. වෙනත් පාලන අවශ්‍යතා.

3. එමෙන්ම, මෙම කටයුත්ත යුද්ධ හමුදාවේ සහ දුම්රිය දෙපාර්තමේන්තුවේ සම නායකත්වයෙන් ඉටුකල යුතු අතර, විමර්ශණ කටයුතු හා කාලය සංවිධානය කරගැනීම සඳහා දිස්ත්‍රික් ප්‍රධාන ඉංජිනේරු අනුරාධපුර - RF ඇලෙක්සැන්ඩර් මහතා (0773621919) සම්බන්ධ කර ගත යුතුවේ. තවද හකාස අණසක (වන්නි) සමග සම්බන්ධතාවයෙන් යුතුව අවශ්‍යතාවය පරිදි අදාල වෘත්තිය නිලධාරි/සෙනින්ගේ සහයෝගය ලබාගැනීමට කටයුතු කරනමෙන් දන්වා සිටිමි.

4. කරුණු එසේ හෙයින්, මෙම ව්‍යාපෘතිය සඳහා ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්‍යාලයේ දායකත්වයද සපයන බැවින්, ඔවුන් දැනුවත් කිරීම සඳහා ඉහත ඇස්තමේන්තු වාර්ථා **2025** මාර්තු මස **26** වන දින **1800** පැයට ප්‍රථම ලබාදීමට කටයුතු කරන ලෙසටත් ව්‍යාපෘතිය සඳහා සම්බන්ධීකරණ නිලධාරියෙකු පත්කර ඔහුගේ තොරතුරු **2025. 03. 24** වන දින **1800** පැයට ප්‍රථම මෙම මූලය වෙත ඉදිරිපත් කරන ලෙසටත් වැඩිදුරටත් දන්වා සිටිමි.

සීමාන්විතයි

5. **හකාස අණසක (වත්ති) පමණයි:** ඔබ වෙතින් ශිර්පගත අවශ්‍යතාවය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා 21 පාසේමු සමග සම්බන්ධතාවයෙන් යුතුව ඊට අදාල ඉසේරෙ සෙබළුන්ගේ ශ්‍රම දායකත්වය ලබාදීමට කටයුතු කරනමෙන් දන්වා සිටිමි.

**ආර්යසේන ජයගහතන්ත්‍රී ශ්‍රීලසසබ**
ලුතිතන් කර්නල්
ප්‍රමාති 1 (ක්‍රියා)
ආඥාපති වෙනුවට

පිටපත්:
හකාස අණසක (වත්ති)
2 ඉසේරෙ

URGENT